# මොඩියුල අංක 07

# ප්‍රත්‍යවේක්ෂණය

e-Learning by TEA
Teacher Education Administration Branch

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
MINISTRY OF EDUCATION

# ප්‍රත්‍යවේක්ෂණය



ගුරුවරයාට ස්වයං වෘත්තීය ගුරු සංවර්ධනයේ දී වඩාත් ඵලදායී ලෙස යොදා ගත හැකි ප්‍රත්‍යවේක්ෂණය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ ඔබගේ ස්වයං දැනුවත්භාවය සහ සවිඥානික බව ඔබටම වටහා දීමෙන් ඔබව දිරිමත් කරයි. ඔබ විසින් වර්ධනය කරගත යුතු අංශ සහ ඔබ විසින් පැවතගෙන යනු ලබන ශක්තිමත් අංශ හඳුනා ගැනීමට ඉන් ඔබට හැකියාව ලැබේ. සිසුන් සමඟ ක්‍රියා කරනවිට කළයුතු සහ නොකළයුතු දේ හඳුනා ගැනීමට ඔබට ප්‍රත්‍යෝවේක්ෂණය ඉඩ සලසයි. ඔබේ ඉගැන්වීමට සිසුන් දක්වන ප්‍රතිචාර ගැන ගැඹුරින් සිතීමට ඔබට හැකියාව ලැබේ.

**හැදින්වීම.**

ගුරුවරයාට විවිධ ආකාරයේ ස්වයං වෘත්තීය ගුරු සංවර්ධන අවස්ථාවල යොමුවිය හැකි වෙයි . ඒ අතර **ප්‍රත්‍යවේක්ෂණය** , වෘත්තීය සහරා පරිශීලනය කිරීම, ප්‍රකාශන පළ කිරීම, වෘත්තීය සම්මන්ත්‍රණවලට සහභාගීවීම, පර්යේෂණවල නිරතවීම ආදිය වැදගත් වේ. මෙය අධ්‍යයනය කිරීමෙන් ගුරුවරයෙකු වශයෙන් ඔබට පාසල් පාදක වෘත්තීය ගුරුසංවර්ධනයෙහි ලා ස්වයං තක්සේරු ශිල්පක්‍රමයක් වශයෙන් ප්‍රත්‍යවේක්ෂණය පිළිබඳව ක්‍රියාත්මක විය හැකි ආකාරය පිළිබඳව දැනුවත් විය හැකිය. මෙම මොඩියුලයේ අරමුණ ප්‍රත්‍යවේක්ෂණ ව්‍යවහාර ප්‍රගුණ කිරීමේ කුසලතා සංවර්ධනය කිරීමේ අවස්ථා සම්පාදනය කිරීමයි.

**අරමුණු:**

- **ප්‍රත්‍යවේක්ෂණ සංකල්පය හඳුනාගෙන ගුරු වෘත්තීය සංවර්ධනයට භාවිත කිරීම පිළිබඳව අත්දැකීම් ලබාදීම**
- ස්වයං තක්සේරු ශිල්ප ක්‍රමයක් වශයෙන් ප්‍රත්‍යවේක්ෂණයේ ඇති ප්‍රබලතා හඳුනා ගැනීම
- ස්වයං අභිමානයෙන් යුතු නිපුණතාවලින් හෙබි ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීම

**ඉගෙනුම් පල:**

- **ප්‍රත්‍යවේක්ෂණ ක්‍රියාවලියෙහි ස්වභාවය පැහැදිලි කරයි.**
- **ප්‍රත්‍යවේක්ෂණය ගුරු කාර්යභාරයෙහිලා වැදගත් වන ආකාරය පැහැදිලි කරයි.**
- **ප්‍රත්‍යවේක්ෂණයෙහි යෙදිය හැකි ප්‍රධාන අවස්ථා හඳුනා ගනියි.**
- **ප්‍රත්‍යවේක්ෂණයෙහි සෘජු ප්‍රතිලාභ උදාහරණ ඇසුරින් ඉදිරිපත් කරයි.**

**පෙළ ගැස්ම:**

1. **පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධනයෙහි ලා ස්වයං තක්සේරු ශිල්ප ක්‍රමයක් වශයෙන් ප්‍රත්‍යවේක්ෂණය**
2. **ප්‍රත්‍යවේක්ෂණය පිළිබඳ නිර්වචන**
3. **ප්‍රධාන ප්‍රත්‍යවේක්ෂණ අවස්ථා**
4. **ප්‍රත්‍යවේක්ෂණය යටතේ වාර්තා කිරීම**
5. **ප්‍රත්‍යවේක්ෂණයේදී උපයෝගී කරගත හැකි ප්‍රශ්න**
6. **ප්‍රත්‍යවේක්ෂණයේ ප්‍රතිලාභ**

Teacher Education Administration Branch

**ප්‍රත්‍යවේක්ෂණය හෙවත්** ස්වයං තක්සේරුව ඉගෙනීම වැඩි දියුණු කිරීම සඳහා යොදාගතහැකි බලවත් යාන්ත්‍රණයකි. සංකල්ප සහ කුසලතා ඉගෙනීම සඳහා පිහිටුවා ඇති ඉගෙනුම් ඵල සපුරාලන ආකාරය ඉගෙනුම අතරතුරදී සහ ඉන් පසුව සිතා බලන සිසුවා මෙන්ම ගුරුවරයාද එම ඉගෙනුම සාර්ථක කරගැනීමට දිරිමත් වේ . එය ඉගෙන ගන්නා දේ පිළිබඳ අධිප්‍රජානනය වන අතර එමගින් ඉගෙනීම සඳහා ඵලදායී භාවිතයන් ප්‍ර වර්ධනය කරයි. යම් පැවරුමක් හෝ පාඨමාලාවක් ඔවුන්ගේ අධ්‍යාපනයේ අපේක්ෂිත සන්දර්භයට ගැලපෙන්නේ කෙසේද යන්න ගැන සිතා බැලීමට සිසුන් දිරිමත් කරන්නේ **ප්‍රත්‍යවේක්ෂණයයි** . එය රැකියාවේදී හෝ ශාස්ත්‍රීය පර්යේෂණවලදී ප්‍රයෝජනවත් වන පරාවර්තක කුසලතා ලබා දෙයි.

බොහෝ ආකාරයේ ඇගයීම් ක්‍රම ශිෂ්‍යයා නිෂ්ක්‍රීය භූමිකාවක තබයි. ශිෂ්‍යයාට හුදෙක් ගුරුවරයා වෙතින් ප්‍රතිපෝෂණ ලැබේ. නමුත් **ප්‍රත්‍යවේක්ෂණයේ යෙදෙන** සිසුන්ට ස්වයංක්‍රීය ඉගෙන ගන්නන් වීමට සහ ඔවුන් ඉගෙන ගත යුතු දේ ගැන සිතීමට අවස්ථාව ලැබෙයි. ස්වයං-ඇගයීමේ කුසලතා ඉගෙන ගැනීමෙන්, සිසුන්ට ඔවුන්ගේ වෘත්තිය තුළ සහ ජීවිත කාලය පුරාම මුහුණ දෙන වෙනත් විවිධ සන්දර්භයන් තුළ අඛණ්ඩව **ප්‍රත්‍යවේක්ෂණයේ** යෙදීමෙන් තමන් මුහුණ දෙන ගැටළු වලට වඩාත් සාර්ථක ප්විසඳුම් වලට එළඹිය හැකිය.

**<u>පූර්ව ක්‍රියාකාරකම.</u>**

**ඔබගේ පිළිතුරු නිවැරදි ද යන්න පරීක්ෂා කරන්න.**

1.ගුරුවරයෙකුට ස්වයං වෘත්තීය සංවර්ධනයේ යෙදිය හැකි ද ඔව් ☐ නැත ☐ කිව නොහැක ☐

2.ප්‍රත්‍යවේක්ෂණය පාඩමින් පසු ව යෙදිය යුතු ක්‍රියාවලියකි. ඔව් ☐ නැත ☐ කිව නොහැක ☐

3.ප්‍රත්‍යවේක්ෂණයෙන් ගුරුවරයෙකුට පාඩමේ අඩුපාඩු හඳුනාගත හැකිය

☐ ඔව් ☐ නැත. ☐ කිව නොහැක

4. ප්‍රත්‍යවේක්ෂණ වාර්තා ලිවීමේදී භාෂාව පිළිබඳව සැලකිලිමත්විය යුතු වේ.

☐ ඔව් ☐ නැත. ☐ කිව නොහැක

5. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ගුරුවරයෙකුට මෙන්ම ශිෂ්‍යයාට ද .ප්‍රත්‍යවේක්ෂණයේ යෙදිය හැකි ය.

☐ ඔව් ☐ නැත. ☐ කිව නොහැක

3. ප්‍රත්‍යවේක්ෂණ පිළිබඳ නිර්වචන

- බරපතල චින්තනය හෝ සලකා බැලීම.- Oxford Languages
- යම් විෂයයක්, අදහසක් හෝ අරමුණක් සලකා බැලීම
- ඔබ නිවැරදිව කළ දේවල්, ඔබේ සාර්ථකත්වයන් ගැන ඔබ මෙනෙහි කරන්න, එය ඔබට සෑම කුඩා සාර්ථකත්වයක්ම සැමරීමට ඉඩ සලසයි. ඔබ එය කෙතරම් නිවැරදිව කර ඇත්ද යන්න තේරුම් ගැනීමටත් , ඔබේ ජීවිතයේ ඔබ කර ඇති යහපත් දේ තේරුම් ගැනීමටත් ප්‍රත්‍යවේක්ෂණය ඔබට ඉඩ සලසයි.

**ප්‍රත්‍යවේක්ෂණ අවස්ථා:**

**පාඩම් සැලැස්මේ ගුරුවරයාගේ ප්‍රත්‍යවේක්ෂණය යනු සෑම පාඩමක් අවසානයේම, ගුරුවරයා ලද අත්දැකීම් පිළිබිඹු කර එහි කාර්යක්ෂමතාව විශ්ලේෂණය කිරීමයි. මෙම ක්‍රියාවලිය කොටස් දෙකකින් සමන්විත වේ. එනම් ප්‍රත්‍යවේක්ෂණය සහ විශ්ලේෂණයයි.**

**ප්‍රත්‍යවේක්ෂණය : පාඩමේ සහ ගුරුවරයා වන ඔබගේ සමස්තය ගැන සිතා බැලීම.**
**පාඩම අතරතුරදී, වෘත්තියේදී ඔබට ඇති වූ හැඟීම්, ඔබ පුදුමයට පත් කරන දෙයක් හෝ ඔබට විරාමයක් ඇති කළ දෙයක් ගැන කතා කළ හැකිය**

**මෙහිදී .....**

1. **ඔබ සැලසුම් කළ දේට වඩා වෙනස් ලෙස ඔබේ පාඩමේ කුමන අංගයන් ක්‍රියාත්මක වීද? ඇයි එහෙම කළේ?**
2. **ඔබ මෙම පාඩම වෙනස් සිසුන් පිරිසකට ඉගැන්වීමට යන්නේ නම්, ඔබ වෙනස් ලෙස කරන්නේ කුමක්ද? මන්ද?**
3. **ඔබේ පාඩමේදී ඔබ පුදුමයට පත් කළේ කුමක්ද?**
4. **පාඩමේ මතකයට එන විශේෂ අවස්ථාවක් විස්තර කරන්න. ඇයි එහෙම තෝරගත්තෙ? එම නිශ්චිත මොහොත ගැන එතරම් ව්‍යාකූල වන්නේ ඇයි?**
5. **ඔබේ පාඨමාලාල සාහිත්‍යය සහ අද ඔබේ පාඩමට ඔබට ඇති කර ගත හැකි සම්බන්ධතා මොනවාද? පෙර පාඩම් හෝ අත්දැකීම් තිබේද?**

**විශ්ලේෂණය: විශ්ලේෂණයේදී පාඩමේ සඵලතාවය ආමන්ත්‍රණය කරයි - සැලසුම කොතෙක් දුරට සිදුවීද යන්න ගැන, සිසු ඉගෙනීම ගැන සහ ඔබ පාඩමෙන් රැස් කරගත් සාක්ෂි සමඟ ඔබේ පාඩම් සැලැස්මේ දක්වා ඇති අරමුණු සපුරාලන ආකාරය තක්සේරු කරන්න.**

- **ඔබේ ඉගැන්වීම් ක්‍රම ඵලදායී වූයේ කුමන ආකාරවලින්ද? ඔබ එය දන්නේ කොහොම ද?**
- **ඔබේ ක්‍රියාකාරකම් ඵලදායී වූයේ කුමන ආකාරවලින්ද? ඔබ දන්නේ කොහොම ද?**

ගුරුවරයෙකුට ආකාර තුනකින් ස්වකීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳව ප්‍රත්‍යාවේක්ෂණයේ යෙදිය හැකි ය

1 පාඩම ආරම්භ කර ක්‍රියාත්මක කරගෙන යන අතරතුර දී ප්‍රත්‍යාවේක්ෂණයේ යෙදීම. මෙය සමකාලීන ප්‍රත්‍යාවේක්ෂණය ලෙස හඳුන්වනු ලැබේ. එවැනි අවස්ථාවක ගුරුවරයා විසින් කලයුතු ප්‍රත්‍යාවේක්ෂණය පහත දැක්වේ.

"අද ළමයින්ව අඹ ගහ යටට ගෙනිහින් පාඩම කරන්නයි සැලසුම් කලේ. ඒත් දැන් විනාඩි 10ක් පරක්කු වෙලා නිසා දැන් යන්න ගියොත් වත් විනාඩි 10ක් යනවා. පන්තිය ඇතුලෙ ඉඳගෙන මේ ක්‍රියාකාරකම් කරන්නත් බැහැ. ඒ මදිවට ආව වෙලාවෙ ඉඳල නඩු ගේනවා. කෑ ගහනවා. මම පරක්කු වෙච්චි විනාඩි 10 දී ළමයින් අතර විවිධ ගැටුම් ඇතිවෙලා තියෙනවා. මගේ ප්‍රමදය වලක්වාගන්න ක්‍රමයක් හොයා ගන්නම ඕනි.

2 පාඩම උගන්වා අවසන් කිරීමෙන් පසු කරනු ලබන ප්‍රත්‍යාවේක්ෂණය: මෙය පසු කාලීන ප්‍රත්‍යාවේක්ෂණය ලෙස හඳුන්වනු ලබයි.

ප්‍රමාද වී ඇරඹූ පාඩමක් අවසානයේ ගුරුවරියක ලියූ ප්‍රත්‍යාවේක්ෂණ සටහනක් පහත දැක්වේ.

" අද මේ ඒකකයේ ඉවර කරන්න තිබුන අන්තිම කොටස නිසා පාඩම කරන්න හොඳට සැලසුම් කරගෙන ඉස්කෝලෙ ගියේ. විනෝදජනක ක්‍රීඩාවකින් සංකල්ප හඳුන්වල දීල කණ්ඩායම් කර ගන්නත් ඕනි උනා. ඒත් පළවෙනි විනාඩි 10 ප්‍රමාද වුන නිසා හැම දේම අවුල් උනා. ඒකෙන් අද දවසම අවුල්. සැළසුම් කරපු විදියට නැතිව නිකම් ලඟ ඉන්න ළමයි කණ්ඩායම් කරපු එකෙන් බලාපොරොත්තු වුණ අරමුණ ඉෂ්ට උනේ ම නැහැ. දක්ෂ ළමයි එකම කණ්ඩායම් වලට වැටුනේ. ඒ නිසා දුර්වල ළමයි වැඩ නොකර හයියෙන් කෑ ගහන්න පටන් ගත්තා. බලෙන් නිශ්ශබ්ද කෙරෙව්වට මටම තේරුණා පාඩම ටිකක් හරි තේරුණේ පළවෙනි කණ්ඩායමේ තුන් හතර දෙනෙක්ට විතරයි කියල. නිවාඩු දවස් දෙකේ කරගෙන එන්න දෙන්න හිටපු පැවරුම දෙන්නත් අමතක උනා. දැන් ඉතින් ඊ ළඟ දවසෙ වැඩේටත් කරදරයිනෙ.

3 ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීමට පෙර ඒ ක්‍රියාව සලසුම් කිරීම සඳහා කරනු ලබන ප්‍රත්‍යාවේක්ෂණය : මෙය ක්‍රියාවක් සඳහා වූ ප්‍රත්‍යාවේක්ෂණය ලෙස හැඳින්වේ. ප්‍රමාද වී පාඩම

කළ ගුරුතුමිය ඉදිරි සතියේ දී ඇරඹීමට සූදානම් වූ පාඩමක් සැලසුම් කිරීම පිළිබඳව ලියන ලද ප්‍රත්‍යාවේක්ෂණ සටහනක් සඳහා උදාහරණයක් පහත දැක්වේ.

" අද දවසේ සිදු උන අඩුපාඩු වළක්වාගෙන හෙට පාඩම සාර්ථක කර ගන්න ටිකක් වැඩිපුර සැලසුම් කරන්න ඕන. හෙට පාඩමට කලින් ප්‍රවේශයට ටිකක් වැඩිපුර කාලය අරගෙන අද හොඳින් පාඩම ග්‍රහණය කරගන්නනොහැකි වූ දරුවන්ට උදව් කරන්න ඕන නිසා පොඩි කතන්දරයක් ඇසුරින් අද කරන්න බැරිඋන ක්‍රීඩාව ටිකක් වෙනස් කරලා ඉදිරිපත් කරනවා. එවිට හොඳින් පාඩම ග්‍රහණය කරගත් දරුවන්ටත් කම්මැලි වෙන එකක් නැහැ"

අපට පුරුදු භාෂා ශෛලියෙන් ප්‍රත්‍යාවේක්ෂණ ලිවීමට අප සූදානම් විය යුතු ය. එවිට සිද්ධියක් ගැන අපට ඇති වූ සිතුවිලි අව්‍යාජ සහ අවංග ලෙස විගසින් ලේඛනගත කිරීමට හැකි වේ. ව්‍යාකරණ ගැන නොසිතා අපට හුරුපුරුදු ලෙස ලියාගෙන යාම ද වැදගත් ය. ලිවීමේ ව්‍යාකරණ දෝෂ පසුව නිවැරදි කර ගත හැකි ය. ඒ අනුව නිවැරදි ලිවීම ද අපට සකස් කර ගත හැකි ය.

4. **ප්‍රත්‍යවේක්ෂණයේ** දී ඇසිය හැකි ප්‍රශ්න

ගුරුවරුන් තමන්ගෙන්ම ඇසිය යුතු ස්වයං ආවර්ජන ප්‍රශ්න

- අද මගේ පාඩමේ හොඳම මොහොත කුමක්ද? මට තවත් එවැනි අවස්ථා ලබා ගත හැක්කේ කෙසේද?
- මගේ වඩාත්ම අභියෝගාත්මක මොහොත කුමක්ද? සහ ඇයි? ඒ අභියෝගාත්මක අවස්ථාවට මා ප්‍රතිචාර දැක්වූයේ කෙසේද?
- මගේ සිසුන් පන්තියේ සිටීමට උනන්දු වූවාද? එසේ නොවේ නම් මම ඔවුන්ව දිරිමත් කරන්නේ කෙසේද?
- අද අන් අය සමඟ මගේ මනෝභාවය කෙසේද?
- අද මගේ සිසුන් මා පුදුමයට පත් කළේ කුමන ආකාරවලින්ද?
- අද මම මගේ සගයන්ට සහාය දුන්නේ කෙසේද සහ මම එය දිගටම කරන්නේ කෙසේද?
- මගේ පුහුණුවීම් වැඩිදියුණු කිරීමට ඇති ලොකුම බාධා මොනවාද සහ මම ඒවා ජය ගන්නේ කෙසේද?
- අද මම මා වෙනුවෙන් කළේ කුමක්ද සහ මෙය වැදගත් වන්නේ ඇයි?

- අපි පන්තියේ කළ ක්‍රියාකාරකම සාර්ථකද? ඇයි නැත්නම් ඇයි?
- මගේ ශිෂ්‍යයන් සමඟ මා ඇති කර ගන්නා සබඳතා ඔවුන්ගේ ඉගෙනීමේ හැකියාවට උපකාරයක් හෝ බාධාවක්ද?
- මගේ පන්ති කාමරයේ ඇති ගැටළු මගේ අපේක්ෂාවන් පෙර ඉගැන්වීමෙන් විසඳා ගත හැකිද?
- මගේ සිසුන් කෙරෙහි මගේ හැසිරීම සහ ආකල්ප ඔවුන්ගේ ඉගෙනීමට බාධාවක්ද?
- මම අද වැඩට යන්න ආසද?
- මම මෑතකදී මගේ සිසුන්ට ලබා දී ඇති තේරීම් මොනවාද?
- මගේ එක් එක් ශිෂ්‍යයාගේ පෞද්ගලික ජීවිතය ගැන මට අවම වශයෙන් එක් දෙයක්වත් පැහැදිලි කළ හැකිද?
- මගේ ඇගයීම් ඇත්ත වශයෙන්ම ඉගෙනීම පිළිබිඹු කරන්නේද? නැතහොත් හුදෙක් කාර්යය සම්පූර්ණ කිරීම හෝ කටපාඩම් කිරීමේ කුසලතා පමණක් මැන්නේද?
- මා මෙම විශේෂිත පාඩම ආවරණය කිරීමට තෝරා ගත්තේ ඇයි?
- මගේ සිසුන් සැබවින්ම ඉගෙන ගන්නා බවට මා සතුව ඇති සාක්ෂි මොනවාද?
- අරගල කරන ශිෂ්‍යයෙකුට ප්‍රයෝජනවත් විය හැකි නව උපාය මාර්ග මොනවාද?
- මගේ පන්තියේ පැහැදිලිවම සාර්ථක වන සිසුන්ට මම අභියෝග කරන්නේ කුමන ආකාරයෙන්ද?
- සිසුන් මගේ පන්ති කාමරයේ ඉගෙන නොගන්නා විට මා කරන්නේ කුමක්ද?
- මෙම ක්‍රියාකාරකමෙන් ප්‍රතිලාභ ලබන සිසුන් කවුද?
- මෙම ක්‍රියාකාරකමෙන් ප්‍රතිලාභ නොලබන සිසුන් මොනවාද?
- මට තවමත් වෘත්තීය වශයෙන් දියුණු විය හැක්කේ කුමන ක්ෂේත්‍රවලද?
- මගේ සගයන්ට ඔවුන්ගේ ශිෂ්‍යයාගේ ඉගෙනීමේදී මට සහාය විය හැක්කේ කුමන ආකාරවලින්ද?
- ගුරුවරයෙකු ලෙස මගේ ක්‍රියාවන් මගින් සියලුම සිසුන්ට උසස් මට්ටමකින් ඉගෙන ගත හැකි බවට මට විශ්වාසය කළහැකි ද?
- මගේ ශිෂ්‍යයාගේ මාපියන් සමඟ මා ඇතිකරගෙන ඇති සබඳතා ඉගෙනීම වැඩිදියුණු වීමට ඉවහල් වන්නේද?
- ඉගැන්වීම ගැන මා තුළ ආස්වාදයක් ලබා ගැනීමට මම මගේ පන්ති කාමරය තුළ උත්සාහ කර ඇති නව අදහස් මොනවාද?
- මා ඵලදායි ගුරුවරයෙකු ලෙස සිටීම සහතික කිරීම සඳහාල ආතතියෙන් මිදීමට සහ මගේම මානසික සෞඛ්‍යය කෙරෙහි අවධානය යොමු කිරීමට මා මෑතක දී කර ඇත්තේ කුමක්ද?

- මගේ වෘත්තිය තුළ මට යථාර්ථවාදීව අඩු ප්‍රමුඛතාවයක් ලබා දිය හැකි මා දැනට කරමින් සිටින දේවල් මොනවාද?
- පසුගිය සති දෙක තුළ මම මගේ මිතුරන් සහ පවුලේ අය සමඟ කොපමණ කාලයක් ගත කළාද?
- මම මගේ සිසුන් සමඟ ඉටු කිරීමට උත්සාහ කරන්නේ කුමක්ද?
- මගේ කෙටි කාලීන ඉලක්ක මොනවාද?
- මගේ දිගුකාලීන ඉලක්ක මොනවාද?
- මෙම ඉලක්ක වැදගත් වන්නේ ඇයි?
- මෙම ඉලක්ක පැමිණෙන්නේ කොහෙන්ද? 21 වැනි සියවසේ ලෝකයේ ජීවත් වන කෙනෙකුට ඒවා ප්‍රයෝජනවත්ද?
- මගේ ඉලක්ක පාසලේ ඉලක්කවලට සම්බන්ධ වන්නේ කෙසේද?
- මා වර්ධනය කිරීමට උත්සාහ කරන විවේචනාත්මක කුසලතා මොනවාද?
- සිසුන් ඉගෙන ගන්නා ආකාරය ගැන මගේ විශ්වාසයන් මොනවාද?
- ඉගෙනීම සඳහා ධනාත්මක වාතාවරණයක් ඇති කරන්නේ කෙසේද?
- මගේ සිසුන් ගවේෂණයට යොමු  කිරීමට මට අවශ්‍ය අත්‍යවශ්‍ය ප්‍රශ්න මොනවාද?
- මා නිතිපතා භාවිතා කරන මූලික උපදේශන උපාය මාර්ග මොනවාද?
- මගේ ශිෂ්‍යයන් මගේ ඉලක්ක සපුරාගත් විට මා දන්නේ කෙසේද?
- මගේ ශිෂ්‍යයන් කොතරම් හොඳින් අධ්‍යයනය කරනවාද යන්න මැනබැලීමට ඔවුන්ගෙන් ප්‍රතිපෝෂණ ලබා ගන්නේ කෙසේද?
- සිසුන්ගේ ඉගෙනීම වැඩිදියුණු කිරීම සඳහා මම ප්‍රතිපෝෂණ භාවිතා කරන්නේ කෙසේද?
- මම මගේ සිසුන් සඳහා ඉගෙනීම අභිරුචිකරණය සහ පුද්ගලීකරණය කරන්නේ කෙසේද?
- මගේ ඉගැන්වීමේ විශේෂ සහ සුවිශේෂිතා  මොනවාද?
- මාගේ වෘත්තීය වැඩිදියුණු කිරීම සඳහා මම මගේ ඉගැන්වීමේ කටයුතු  කරන්නේ කෙසේද?
- මම ගුරුවරයෙකු වූයේ ඇයි?

**ඕනෑම ශිෂ්‍යයෙකුට තම ඉගෙනීම ගැන සිතීමටද උපකාර වන ඉගෙනීම පිළිබඳ පුළුල් ප්‍රත්‍යවේක්ෂණ ප්‍රශ්න කිපයක් ....**

- අද ඔබ පුදුමයට පත් කළේ කුමක්ද සහ ඇයි?
- අද ඔබ ඉගෙන ගත් වැදගත්ම දේ කුමක්ද? ඇයි ඔබ එහෙම හිතන්නේ?
- ඔබට වැඩිදුර ඉගෙන ගැනීමට අවශ්‍ය කුමක්ද සහ ඇයි?

- ඔබ වඩාත්ම නිර්මාණශීලී වූයේ කවදාද? සහ ඔබ සිතන්නේ ඇයි?
- අද ඔබට කුතුහලයක් ඇති කළේ කුමක්ද? ඔබ කුතුහලයෙන් සිටින විට ඉගෙනීම වෙනස් වන්නේ කෙසේද?
- අද ඔබ හොඳම තත්වයේ සිටියේ කවදාද සහ ඇයි?
- අපි එකම දේ අධ්‍යයනය කරමින් සිටින අතර ඔබට ඕනෑම දෙයක් තීරණය කර ප්‍රවේශ විය හැකි යැයි උපකල්පනය කළහොත්), ඔබ මෙහෙට ආරම්භ කරන්නේ කොතැනින්ද? මන්ද?
- ඔබ දන්නා දේ සමඟ ඔබට කළ හැක්කේ/කළ යුත්තේ කුමක්ද?

5. **ප්‍රත්‍යවේක්ෂණයේ** ප්‍රතිලාභ

- වෘත්තීය වර්ධනය
- නවෝත්පාදනය වැඩි දියුණුවීම
- ඉගැන්වීමට පහසුකම් සැලසීම
- ගුරු-ශිෂ්‍ය සබඳතාව ඉහළ නැංවීම
- පාඩම් වඩාත් සජීවී හා රසවත්වීම
- ගැටළු විසඳීම වැඩිදියුණු වීම
- පන්තිකාමර ප්‍රජාතන්ත්‍රවාදය නැංවීම
- සිසුන්ගේ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම
- පන්තියේ කාර්යවල නියැලීම වැඩි වීම
- විවේචනාත්මක චින්තනය සහ අභියෝගවලට මුහුණ දීමේ කුසලතා වර්ධනය වීම
- ශිෂ්‍ය අභිප්‍රේරණය වැඩි දියුණු වීම
- ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සමස්ත කාර්යක්ෂමතාව වැඩි දියුණු වීම

e-Learning by TEA
Teacher Education Administration Branch

<u>පරිශීලන ග්‍රන්ථ :</u>


- වෘත්තීය ගුරු ප්‍රත්‍යවේක්ෂණය
- **Gibbs, G (1988). Learning by doing: a guide to teaching and learning methods. Oxford: Further Education Unit, Oxford Polytechnic.**
  **Honey, P and Mumford, A (1986).In Mumford, A, Effective Learning. London: IPD.**
- **Schön, D (1983). The reflective practitioner: how professionals think in action. New York: Basic Books.**
- **Williams, K, Woolliams, M and Spiro, J(2012). Reflective Writing. Basingstoke:Palgrave MacMillan.**

**Online resources:**

- **Open University, Skills for OU Study. Beaware of your habits. [online]. Available at: www2.open.ac.uk/students/skillsforstudy/**
- **be-aware-of-your-habits.ph[Accessed 5 July 2012]Plymouth University, Learning Development.(2010)Reflection[online].Availableat:www.learningdevelopment.plymouth.ac.uk/**
- **LDstudyguides/pdf/11Reflection.pdf[Accessed 5 July 2012]**
- **Academic Skills Centre. May 2014**
- **https://www.usf.edu/education/areas-of-study/elementary-education/documents/reflection-tool.pdf**

youtubecom/watch?v=TizriW(http//www.youtubecom/watch?v=TizriWqEvKE qEvKE